*සැ. යු.-* මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2014/2015 වර්ෂය සඳහා කෑගල්ල අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය මෙම *ගැසට්* අංකය හා එයට අදාළ පළ කරන දිනය යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,906 - 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2015.03.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 354 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 355 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 357 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 364 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**රාත්තල් 80 රේල්පීලි සඳහා සරිලන රබර් පෑඩ් (Rubber Pads) 400,000ක් ශ්‍රී ලංකා දුම්රිය සේවයට මිලදී ගැනීම**

01. රාත්තල් 80 රේල්පීලි සඳහා සරිලන රබර් පෑඩ් 400,000ක් මිලදී ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (ප්‍රධාන) විසින් නිෂ්පාදකයින්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

02. ලංසු භාරගැනීම 2015.03.13 වැනි දින ප. ව. 2.00 ට අවසන් කරනු ඇත.

03. රු. 2,500 ක ආපසු ගෙවනු නොලබන ලියවිලි ගාස්තුවක් ගෙවීමෙන් 2015.03.12 වැනි දින ප. ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම 2015.03.13 වැනි දින ප. ව. 2.00 ට අවසන් කරන අතර, එසේ අවසන් කළ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරී කාර්යාලයේ දී විවෘත කරනු ඇත. ලංසු විවෘත කරන මෙම අවස්ථාවට පැමිණෙන ලෙස ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එසේ නැතහොත් අතින් ගෙනවිත් භාරදිය යුතු ය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත,
කොළඹ 10.

ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම ගාස්තු ගෙවීමකින් තොරව, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාරයාලයේ දී සිදු කළ හැකිය .

වැඩිදුර විස්තර සඳහා විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : එස්ආර්එස්/එෆ් 7221

03-270

---

**ටෙන්ඩර් දැන්වීම**

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ ආ 12/වාහන වෙන්දේසි (3) 2003 හා 2003.12.10 දිනැති චක්‍රලේඛය අනුව

කෑගල්ල, රුවන්වැල්ල, මාවනැල්ල යන මහෙස්ත්‍රාත් අධිකරණවල රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් වාහන විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 2015ක් වූ මාර්තු මස 16 වැනි දින සිට මාර්තු මස 27 වැනි දින පෙ. ව. 9.30 දක්වා කෑගල්ල මහාධිකරණ කාර්යාලයේ දී භාරගනු ලැබේ.

ටෙන්ඩර්පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කෑගල්ල යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර එවීමේ දී ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ "ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතු ය.

**අදාල වාහන පිළිබඳ විස්තරය**

| *නඩු අංකය* | *වාහනය* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|
| | | *ආපසු ගෙවන* | *ආපසු නොගෙවන* |
| රුවන්වැල්ල මහෙ/අධි. 43502 | S. G. J. C. 9312 ත්‍රිරෝද රථය | 2,000.00 | 100.00 |
| රුවන්වැල්ල මහෙ/අධි. 35123 | S. G. Y. B. 6956 ත්‍රිරෝද රථය | 2,000.00 | 100.00 |
| රුවන්වැල්ල මහෙ/අධි.84313 | 48-5861 දරන ටොයොටා ලොරි රථය | 5,000.00 | 100.00 |
| මාවනැල්ල මහෙ/අධි/21807 | 41-8996 මිට්ෂුබිසි කැන්ටර් වර්ගයේ ලොරි රථය (කොටස් සඳහා) | 7,500.00 | 100.00 |
| කෑගල්ල මහෙ/අධි. ඒ. ආර්. 6888 | JY 9936 ටොයොටා කොරොල්ලා කාර් රථය | 10,000.00 | 100.00 |

01. ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කර අනුමැතිය සඳහා මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

02. ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතියෙන් පසු 2015 මාර්තු මස 27 වැනි දින පෙ. ව. 11.30 ට වැඩිම ඉල්ලුම්කරුවන්ට එම වාහන විකුණනු ලබන බැවින්, ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු අනන්‍යතාව තහවුරු කිරීම සඳහා පිළිගත් හැඳුනුම්පතක් ද රැගෙන නියමිත වේලාවට පැමිණ සිටිය යුතු ය.

03. කිසියම් ටෙන්ඩර්කරුවකු විසින් විධිමත් පරිදි ටෙන්ඩර්පත් ඉදිරිපත් කර, යම් හෙයකින් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු පැමිණ නොසිටියහොත් එම ටෙන්ඩරය අවලංගු වනු ඇත.

04. ඉහත සඳහන් පරිදි එක් එක් වාහනය සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් සහ ඉහත සඳහන් පරිදි ආපසු ගෙවන ඇප තැන්පත් මුදලක් කෑගල්ල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ගෙවා ආකෘති පත්‍ර ලබාගත යුතු ය.

ඊ. ඒ. ජී. ආර්. අමරසේකර,<br>
මහාධිකරණ විනිසුරු,<br>
කෑගල්ල.

2015 පෙබරවාරි මස 19 වැනි දින,<br>
කෑගල්ල මහාධිකරණයේ දී ය.

03-246

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති නඩු භාණ්ඩ 2015.03.28 සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ එදින පෙ. ව. 9.30 සිට 10.00 දක්වා කාලය තුළ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය මෙම අධිකරණය සතු ය.

05. වෙන්දේසියේ දී මිලදී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම කළ යුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

07. වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කිරීම අනිවාර්ය වේ.

ඒ. එන්. ජයකි ද අල්විස්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
කොළඹ 10

2015 පෙබරවාරි මස 24 වැනි දින,<br>
මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

#### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 37005/10 | අංක ඩබ්. පී. ජේ. සී. 5359 ත්‍රීරෝද රථය |
| 2. | 60583/11 | අංක ඩබ්. පී. ඕ. ආර්. 1519 යතුරු පැදිය |
| 3. | 68387/12 | අංක ඩබ්. පී. ජේ. කිව්. 8621 යතුරු පැදිය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 4. | 43776/10 | අංක ඩබ්. පී. යූ එල්. 3873 යතුරු පැදිය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 5. | 40037/10 | අංක ඩබ්. පී. යූ. බී. 7020 යතුරු පැදිය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 6. | 86507/08 | අංක 14 ශ්‍රී 0543 ත්‍රීරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 7. | 10634/09 | අංක ඩබ්. පී. කිව්. එස්. 7389 ත්‍රීරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 8. | 22875/10 | අංක 17 - 1453 ත්‍රීරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 9. | 22462/10 | අංක 205 - 6706 ත්‍රිරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 10. | ඒ/4651/14 | අංක එස්. පී. යූ. ජේ. 4923 යතුරු පැදිය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 11. | ඒ/3043/12 | අංක ඩබ්. පී. ටී. ජේ. 9712 යතුරු පැදිය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 12. | ඒ/3046/12 | අංක 14 - 2805 ත්‍රිරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 13. | ඒ. 52370/11 | අංක ඩබ්ලිව්. පී. කිව්. ඩී. 7750 ත්‍රිරෝද රථය (අමතර කොටස් සහ යකඩ සඳහා) |
| 14. | 12452/13 | යකඩ මේස 01ක් පුටු 03ක් (කැඩී ගොස් ඇත) |
| 15. | 18851/14 | ලී පුටු 05 මේස 01 (ප්ලාස්ටික්) ප්ලාස්ටික් පුටු 10ක් |
| 16. | 18855/14 | යකඩ පුටු 10 ප්ලාස්ටික් පුටු 04 වයිට් බෝඩ් 02 (දිරා ගොස් ඇත) බිත්තියේ එල්ලන වයිට් බෝඩ් 01ක් (දිරාගොස් ඇත) |
| 17. | 18853/14 | කුෂන් කරන ලද මේස විට්ටම් 06 (දිරාගොස් ඇත) කැරකෙන පුටු 08ක් |
| 18. | 2294/13 | මේස 01, පුටු 06ක් |
| 19. | 18854/14 | මේස 01 (කැඩී ගොස් ඇත) පුටු 06 (තරමක් අබලන්) වීදුරු බෝල් 01ක් |
| 20. | 5906/13 | පැනසොනික් වර්ගයේ රූපවාහිනි යන්ත්‍රය/ දුරස්ථ පාලකය එල්. ජී. වර්ගයේ ඩී. වී. ඩී. ප්ලේයරය/ දුරස්ථ පාලකය |
| 21. | 50483/11 | ටොෂිබා වර්ගයේ අඟල් 36 වර්ණ රූපවාහිනි යන්ත්‍රය ඩී. වී. ඩී. අංක NS 508P ඩී. වී. ඩී. යන්ත්‍ර 01යි දුරස්ථ පාලකය |
| 22. | 85947/12 | පැනසොනික් වර්ගයේ රූපවාහිනි යන්ත්‍රය, කලු පැහැති ඩෙන්නි වර්ගයේ ඩී. වී. ඩී. යන්ත්‍රය, වයර් කෝඩ් 01යි |
| 23. | ඒ/3078/12 | ලැප්ටොප් පරිගණකය |
| 24. | ඒ/5035/14 | ටී. 7.9 ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරයක් |
| 25. | ඒ/3042/12 | වාහන බැටරි 05ක් |
| 26. | ඒ/4435 | අමානෝ වර්ගයට අයත් තහඩු 04, යකඩ පටි 03ක් |
| 27. | ඒ/3079/12 | විවිධ වර්ගයේ වයර් තොගයක් |
| 28. | ඒ/4436 | ඩොලැක්කි වර්ගයේ වාදන භාණ්ඩයක් |
| 29. | ඒ/3157/12 | ළමා සායවල් 160ක් |
| 30. | ඒ. ආර්. 3338/12 | වාහන බැජ් |
| 31. | ඒ/4503/13 | හිස් පිං කැටයක් |
| 32. | බී 5093/09 (99371/09) | වීදුරු චිමිනයක් විවිධ වර්ගයේ වීදුරු වයින් ග්ලාස් 07 පිත්තල කප් 06 පළතුරු වට්ටියක් (පිත්තල) වීදුරු වාස් 01 වීදුරු අලු බඳුන කුඩා වීදුරු ග්ලාස් 03 ප්ලාස්ටික් ජොග්ගුවක් ඇලුමිනියම් තැටියක් පෝසිලේන් මග් 20 පෝසිලේන් කෝප්ප 09 වීදුරු 02 හැඳි 01 පිහි 03 පිහි 01 රයිස් කුකර් 01 විවිධ ප්‍රමාණයේ රෙදි කාපට් 09 (ඉතා අපිරිසිදු තත්ත්වයේ පවතී) |
| 33. | ඒ/4219/13 | වාහන පැති කණ්නාඩි 02යි |
| 34. | ඒ/3158/12 | ජංගම දුරකථනය |
| 35. | ඒ. ආර්. 3080/12 | ජංගම දුරකථනය |
| 36. | ඒ./4054/13 | ජංගම දුරකථනය |
| 37. | ඒ./2805/12 | ජංගම දුරකථනය |
| 38. | ඒ./4434 | ජංගම දුරකථනය |
| 39. | ඒ./3341/12 | ජංගම දුරකථන 04ක් |
| 40. | ඒ./3342/12 | ජංගම දුරකථන 02ක් |
| 41. | ඒ./3340/12 | ජංගම දුරකථන 06ක් |
| 42. | ඒ./4653/14 | ජංගම දුරකථන 02 මල්ටි ප්ලග් 03 දුරකථන චාජර් 02ක් |
| 43. | 15520/13 | ජංගම දුරකථන 01යි |
| 44. | 13645/13 | ජංගම දුරකථන 01යි |
| 45. | 31137/14 | ජංගම දුරකථන 03යි |
| 46. | 31286/14 | ජංගම දුරකථන 01යි. |

03-384

---

**ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය**

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2015.03.22 ඉරිදා දින පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

නිලුපුලි ලංකාපුර,
මහෙස්ත්‍රාත්,
ගාල්ල.

2015 පෙබරවාරි මස 19 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි ලැයිස්තුව- 2015.03.22**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 2006/14 | පාපැදි | 01 |
| 02. | ඒ. ආර්. 3332/14 | පාපැදි | 01 |
| 03. | ඒ. ආර්. 1479/14 | පාපැදි | 01 |
| 04. | ඒ. ආර්. 1079/13 | පාපැදි | 01 |
| 05. | ඒ. ආර්. 41/15 | පාපැදි | 01 |
| 06. | ඒ. ආර්. 313/15 | පාපැදි | 01 |
| 07. | ඒ. ආර්. 311/15 | පාපැදි | 01 |
| 08. | ඒ. ආර්. 312/15 | පාපැදි | 01 |
| 09. | ඒ. ආර්. 314/15 | පාපැදි | 01 |
| 10. | අංක රහිත | පාපැදි | 01 |
| 11. | අංක රහිත | පාපැදි | 01 |
| 12. | අංක රහිත | පාපැදි | 01 |
| 13. | ඒ.ආර්. 1478/14 | අංකය අපැහැදිලි එම්. ඩී. 90 වර්ගයේ යතුරුපැදි | 01 |
| 14. | 57130 | එස්. යූ. එච්. 8794 යතුරු පැදි | 01 |
| 15. | ඒ. ආර්. 3353/14 | ලි. ප. නොවූ ට්‍රේල් වර්ගයේ යතුරුපැදි | 01 |
| 16. | ඒ. ආර්. 315/15 | ලි. ප. නොකළ මොටෝ යතුරුපැදි | 01 |
| 17. | ඒ. ආර්. 1484/14 | හිමිකරුවෙකු නොමැති බෝට්ටු එන්ජිම | 01 |
| 18. | ඒ. ආර්. 3331/14 | මොට්‍රෝ වර්ගයේ යතුරුපැදි | 01 |
| 19. | ඒ. ආර්. 3352/14 | 126/5461 සී. ඩී. 90 වර්ගයේ යතුරුපැදි | 01 |
| 20. | 22733 | ලි. ප. නොකළ වර්ගයේ යතුරුපැදි | 01 |
| 21. | 9736/13 | යූ. ජී. එස්. ඩී. 6680 අත්ට්‍රැක්ටරය සහ ටේලර් | 01 |
| 22. | 50953 | එස්. පී. එස්. එෆ්. 1568 අත්ට්‍රැක්ටර් | 01 |
| 23. | 25375 | අංකය අපැහැදිලි අත් ට්‍රැක්ටර් | 01 |
| 24. | 25487 | ලි. ප. නොවූ අත් ට්‍රැක්ටර් | 01 |
| 25. | අංක රහිත | අත් ට්‍රැක්ටර් ටේලර් | 10 |
| 26. | ඒ. ආර්. 1476 | දුරකථන රැහැන් රෝල් කොටස් | 02 |
| 27. | ඒ. ආර්. 3136/14 | ජංගම දුරකථන | 03 |
| 28. | ඒ. ආර්. 2676/13 | ජංගම දුරකථන | 01 |
| 29. | ඒ. ආර්. 1383/14 | සිග්සැක් වර්ගයේ මහන මැෂින් | 01 |
| 30. | ඒ. ආර්. 1978/12 | යකඩ බැරල් | 02 |
| 31. | අංක රහිත | දිරාගිය විල්බැරෝවක කොටස් | |
| 32. | 15389 | දම්වැල් කියත් | 01 |
| | | උදලු | 02 |
| | | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| | | කියත් | 01 |
| | | පොරව | 02 |
| | | පිහි | 02 |
| | | අලවංගු | 01 |
| 33. | අංක රහිත | ප්ලාස්ටික් බූලි | තොගයක් |
| 34. | අංක රහිත | වීදුරු බෝතල් | තොගයක් |
| 35. | අංක රහිත | බියර් කේස් | තොගයක් |

03-226

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| ලියාපදිංචි සමාගමේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි කළ දිනය | ලියාපදිංචි කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|
| පැසන්කා (පීවීටී) එල්ටීඩී | පී. වී. 102425 | 2014.11.26 | අංක 96/1, සියඹලාගොඩ, බෙලිඅත්ත |
| සී. ආර්. ප්‍රොපර්ටි සේල්ස් ඇන්ඩ් ඩිවලොපර්ස් (පීවීටී) එල්ටීඩී | පී. වී. 103375 | 2015.01.20 | අංක 131/16, ඔරුතොට පාර, මුදුන්ගොඩ |
| ආර්. එම්. ටී. ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 103346 | 2015.01.20 | අංක 225, නාරන්ගමුව, ගිරිඋල්ල |
| මිලාරෝ ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 103323 | 2015.01.19 | අංක 74, මල්වානවත්ත, ගිරිඋල්ල. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී.,
සමාගම් ලේකම්වරු.

03-277

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනය

01. නම : ඩයිනමික් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
දිනය : 2014.12.04
ලියාපදිංචි අංකය : පී වී 102606
ලිපිනය : අංක 236, මහියංගන පාර, බදුල්ල

02. නම : අයිකොනික් ට්‍රැවල්ස් ඇන්ඩ් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2014.11.24
ලියාපදිංචි අංක : පී වී 102342
ලිපිනය : අංක 26 ඒ, 2 ලේන්, කොස්වත්ත පාර, නාවල

03. නම : වින්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
දිනය : 2009.12.03
ලියාපදංචි අංක : පීවී 70207
ලිපිනය : අංක 5/1, අවිස්සාවේල්ල පාර, මුල්ලේරියාව දකුණ, අංගොඩ.

ඒ. ජී. එස්. කෝපර්රේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-219

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීරිගම, ගිරිඋල්ල පාර, වැරැල්ලවත්ත, අංක 120/14 හි පදිංචි මද්දුම ගමගේ ආසිරි ප්‍රියදර්ශන දිසානායක (විදේශ ගමන් බලපත්‍ර අංක එන් 1408454) හිමිවන මම, රෝමයේ ශ්‍රී ලංකා කන්සියුලර් වන ඩබ්. එම්. ධර්මපාල මහතා විසින් 2010.11.16 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මීරිගම ගිරිඋල්ල පාර, වැරැල්ලවත්ත අංක 120/14 හි පදිංචි රාජතේව මොහොට්ටි අප්පුහාමිලාගේ හෂාරි ප්‍රියංගනී දිසානායක (ජා. හැ. අංක 798143530 V) යන අය හට දෙන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

තව ද, මෙම ඇටෝර්නි බලපත්‍රය 2015.02.09 වැනි දින සිට අවලංගු බවත්, මින් ඉදිරියට මා වෙනුවෙන් රාජතේව මොහොට්ටි අප්පුහාමිලාගේ හෂාරි ප්‍රියංගනී දිසානායක කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ද දන්වා සිටිමි.

එම්. ජී. ඒ. ප්‍රියදර්ශන දිසානායක.

03-220

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : බිකෝ ලින්ක් කාබන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 4158
සමාගමේ අලුත් නම : ඇඩම් කාබන්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ නාමය වෙනස් වූ දිනය : 2015 පෙබරවාරි මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 264, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ 14.

ඇඩම් කාබන්ස් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්
පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2015 පෙබරවාරි මස 19 වැනි දින.

03-221

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී

සමාගමේ නම : ග්ලෝබල් ට්‍රැවල් ඒෂියා (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම් අංකය : පී වී 103832
සංස්ථාගත කරන ලද දිනය : 2015.02.12
ලියාපදිංචි ලිපිනය : අංක 327, යුනියන් පෙදෙස, කොළඹ 02

තිලානි සමරසිංහ,
සමාගම් ලේකම්.

03-222

## පුද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ගඟ අද්දර හොටෙල් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පීවී 62767
ලියාපදිංචි දිනය : 2008 ජනවාරි මස 21 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 295, තංගල්ල පාර, පීක්වැල්ල, මාතර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

විදානආරච්චිගේ දොන් පාලිත ජයසිංහ,
අධ්‍යක්ෂක.

03-223

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කඩවත, පහළ බියන්විල, අංක 135 ඊ හි පදිංචි පුස්හේවලගේ තිලානි ශ්‍යාමේන් වන මම ප්‍රසිද්ධ නොතාරිස් එම්. වී. පී. නිරංජන් විසින් 2012.06.20 වැනි දින සකස් කරන ලද අංක 7025 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් කඩවත, පහළ බියන්විල, අංක 135 ඊ හි පදිංචි ඉලුක්සූරිය ආරච්චිලාගේ නිමල් කාන්ති පෙරේරා හට බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අහෝසි කර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නිබලකාරිය සිදුකරන කිසිදු ගණුදෙනුවකට හෝ කටයුත්තකට මින් ඉදිරියේ දී මා විසින් වග නොකියන බවටත් සමාජවාදී රජරජයටත් පොදු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පුස්හේවලගේ තිලානි ශ්‍යාමේන්.

03-237

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාර ෆීනික්ස් වෙන්චර්ස් (ලිමිටඩ්) යන සමාගම (පී බී 807) එහි නාමය ෆීනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙර සමාගමේ නම : ෆීනික්ස් වෙන්චර්ස් ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 409, 3 වැනි මහල, ගාළු පාර, කොළඹ 3
නව නාමය : ෆීනික්ස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ඉහත සමාගම වෙනුවෙන්,

බ්‍රැන්ඩික්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

03-250

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිළියන්දල, නිවන්තිඩිය, පාසැල් මාවත අංක 2/3, ඒ දරන ස්ථානයේ පදිංචි චමින්ද පුෂ්පකුමාර අතුළුවගේ වන මා විසින් 2013.12.13 වැනි දින කොට්ටාව හි දී අත්සන් කරන්නට යෙදුනු අංක 2918 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පිළියන්දල, මකුළුදූව, ශ්‍රී මේධානන්ද මාවත, අංක 56 ඒ දරන ස්ථානයේ පදිංචි හෝල්ලුපතිගේ සිසිර කුමාර කල්දේරා යන අයට පවරන ලද සියලුම ඇටෝර්නි බලතල 2015.02.20 වැනි දින සිට අවලංගු කරනු ලබන බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

අංක 2/3, ඒ, පාසැල් මාවත,
නිවන්තිඩිය, පිළියන්දල.

03-266

---

## නිවේදනයයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කන්ද මුල්ල ආරච්චිගේ ධම්මික රුවන් පීරිස් විසින් වර්ෂ 2014ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින ලියා සහතික කළ අංක 144 දරන ඇටෝර්නි බලකරයේ ඇටෝර්නි අධිපති වන රන්පටිදේවගේ අනුර අමරසිංහ වන මා විසින් සියලුම කටයුතු කිරීම සඳහා මහනුවර, සංඝරාජමාවත, අංක 32/12 ඒ දරන ස්ථානයේ පදිංචි ගල්කිස්ස දේවගේ ශ්‍යාමිණී මල්කාන්ති අමරසිංහ යන අයට ලබා දී තිබූ බලය මෙයින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට ඇ විසින් කරනු ලබන යම් ගනුදෙනුවක් හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිදු වගකීමක් මා නොකරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බව මෙයින් සියල්ලටම දැනුම් දෙමි.

රන්පටිදේවගේ අනුර අමරසිංහ.

03-278

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මඩවල උල්පත තුරුසෙවන, අංක 21 දරන ස්ථානයේ පදිංචි අබේරත්න ආරච්චිගේ දමයන්ති පුෂ්පා සිල්වා වන මම මහනුවර, දිස්ත්‍රික්කයේ, මහනුවර අනිවත්ත, රිවර්ඩේල් පාර, අංක 35 හි පදිංචි අසිත රුවන්පතිරණ යන අය වෙත 2014.03.25 වැනි දින දරන විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට දී තිබූ ඇටර්නි බලය අද දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අබේරත්න ආරච්චිගේ දමයන්ති පුෂ්පා සිල්වා.

2015ක් වූ පෙබරවාරි මස 14 වැනි දින.

03-279

---

## සංස්ථාපිත දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීමයි

සමාගමේ නාමය : මාසු ෂිපිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 103792
සංස්ථාපිත දිනය : 2015 පෙබරවාරි 11
සමාගමේ ලියාපදිංචි ලිපිනය : "හේමාස් හවුස්" අංක 75, බ්‍රේබෲක් ප්ලේස්, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

හේමාස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-282

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : වී ටී එල් කැම්පස් එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 5242
ලියාපදිංචි කල දිනය : 2014.12.30
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 380, පළමු මහල, ගාළු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-285

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : සාරංග ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 103846
ලියාපදිංචි කළ දිනය : 2015.02.13
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ශාන්ත ජෝශප් තෙල් මෝල බාරේ, කොළඹ පාර, වටිනපහ.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-286

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : භාග්‍යා ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 85680
ලියාපදිංචි කළ දිනය : 2012.04.29
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 101, ඔලගන්දූව, ඉඳුරුව.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-288

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : චතුරංගි මෝටර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 99516
ලියාපදිංචි කළ දිනය : 2014.07.07
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 170/බී, විගොඩ, බෙම්මුල්ල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

03-289

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

ආයතනයේ නම : ටයිමෙක්ස් ඩිජිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කිරීමේ අංකය : පී වී 103435
ලියාපදිංචි කරන ලද ලිපිනය : අංක 455/1, බෞද්ධාලෝක මාවත, කොළඹ 08.

සමාගම් ලේකම්.

03-291

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා ජයවර්ධන විවාහයට පසු හේරත් කෑගල්ල මහාධිකරණ කලාපයේ 2011 ජූනි මස 02 වැනි දින අංක 352 යටතේ අබ්දුල් බුහාරි අබ්දුල් අසාඩ් යන අය විසින් මාවනැල්ල තැපැල්, ගල් අතර, ඇපලාව, අංක 06 දරන ලිපිනයේ පදිංචි කොළඹ ගුරුන්නැහැලාගේ ප්‍රේමාවතී යන අයට දුන් විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව සියල්ලන්ට ම දැනුම් දෙනු ලැබේ.

අබ්දුල් බුහාරි අබ්දුල් අසාඩ්.

අංක 06,
තැපැල්,
ගල් අතර,
ඇපලාව,
මාවනැල්ල.

03-293

---

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : මෙල්ස්ටා ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 104028
සංස්ථාගත කිරීමේ දිනය : 2015.02.24
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.

මෙල්ස්ටා ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2015 පෙබරවාරි මස 25 වැනි දින.

03-420

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කෙරෙන නිවේදනයයි.

සංස්ථාපනය කළ දිනය : 2015.02.05
නම : රේඩියන්ස් රිනිවබල් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 103657
ලියාපදිංචි කාර්යාලය : අංක 2 ඒ, සුලේමාන් ටෙරසය, කොළඹ 05.

කලම්බෝ කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

03-433

---

### පෙරදී පහත සඳහන් ලෙස හඳුන්වන ලද සීමාසහිත ජේ. බී. ටෙක්ස්ටයිල්ස් ඉන්ඩස්ට්‍රීස්

සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීබී 229 දරන සමාගම

**2007 අංක 07 දරන සමාගම් පනතේ 11(5) ඡේදය යටතේ තත්වය හා නාමය වෙනස් කිරීමේ නිවේදනය**

සීමාසහිත ජේ. බී. ටෙක්ස්ටයිල්ස් ඉන්ඩස්ට්‍රීස් සිය තත්වය ප්‍රසිද්ධ සමාගමක සිට පුද්ගලික සමාගමක් යනුවෙන් ද එහි නාමය සීමාසහිත ජේ. බී. ටෙක්ස්ටයිල්ස් ඉන්ඩස්ට්‍රීස් සිට සීමාසහිත ජේ. බී. ටෙක්ස්ටයිල්ස් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) යනුවෙන් ද, 2015 පෙබරවාරි මස 20 වැනි දින සිට බලපවත්වන පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) ඡේදය යටතේ වෙනස් කළ බව මහජනයා වෙත නිවේදනය කරනු ලැබේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 133, මීතොටමුල්ල පාර, වැල්ලම්පිටිය යන ස්ථානයේ ම තවදුරටත් පවතිනු ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

අංක 133, මීතොටමුල්ල පාර,
වැල්ලම්පිටිය.

03-434

---

### පෙරදී පහත සඳහන් ලෙස හඳුන්වන ලද සීමාසහිත ජේ. බී. ෆිෂින් ඉන්ඩස්ට්‍රීස්

සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීබී 785 දරන සමාගම

2007 අංක 07 දරන සමාගම් පනතේ 11(5) ඡේදය යටතේ තත්වය හා නාමය වෙනස් කිරීමේ නිවේදනය

සීමාසහිත ජේ. බී. ෆිෂින් ඉන්ඩස්ට්‍රීස් සිය තත්වය ප්‍රසිද්ධ සමාගමක සිට පුද්ගලික සමාගමක් යනුවෙන් ද එහි නාමය සීමාසහිත ජේ. බී. ෆිෂින් ඉන්ඩස්ට්‍රීස් සිට සීමාසහිත ජේ. බී. ෆිෂින් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) යනුවෙන් ද, 2015 පෙබරවාරි මස 20 වැනි දින සිට බලපවත්වන පරිදි, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) ඡේදය යටතේ වෙනස් කළ බව මහජනයා වෙත නිවේදනය කරනු ලැබේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 133, මීතොටමුල්ල පාර, වැල්ලම්පිටිය යන ස්ථානයේ ම තවදුරටත් පවතිනු ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

අංක 133, මීතොටමුල්ල පාර,
වැල්ලම්පිටිය.

03-435

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ආර් එන් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 103558
ලියාපදිංචි දිනය : 2015.01.28
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 62, ඒ 1, පරණ පාර, වැතර, පොල්ගස්ඕවිට.

මගිනා වරුණ චරිත් මිරන්ඩෝ,
සමාගම් ලේකම්වරු.

03-436

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඩී එන් එන්ටප්‍රයිසස් පැකින් සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 103038
ලියාපදිංචි දිනය : 2014.12.26
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 8/14, ජනතා මාවත, නාවින්න, මහරගම.

මගිනා වරුණ චරිත් මිරන්ඩෝ,
සමාගම් ලේකම්වරු.

03-437

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම මෙලෙස පළ කරනු ලැබේ.

සමාගමේ නාමය : ලංකන් ස්පැනිෂ් ෆ්‍රෙන්ඩ්ෂිප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102162
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 48/3, පූජා ශ්‍රී ධර්මරත්න මාවත, මාදිවෙල, කෝට්ටේ
සංස්ථාගත කළ දිනය : 2014 නොවැම්බර් මස 18 වැනි දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-440

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : කුමාර මරේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65954
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40, ගාලු මුවදොර පිටිය 2, කොළඹ 3
සංස්ථාගත කළ දිනය : 2008 ඔක්තෝබර් 23

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

03-441

---

### නිවේදනයයි

ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම (පී වී 33 දරන) සහ නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම (පී. වී. 47) ඒකාබද්ධ කිරීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාරව (සමාගම් ලියාපදිංචි අංක පී. වී. 47 දරන) නෙක්සස් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගම සමග (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පී. වී. 47 දරන) ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කිරීම පිළිබඳ නිවේදනයයි. මේ අනුව ඒකාබද්ධිත සමාගම ජේකේ මාර්කටින් සර්විසස් (පුද්ගලික) සමාගම වේ. 2015 පෙබරවාරි මස 19 වැනි දින සිට ඒකාබද්ධ වීම බලාත්මක වේ. ඒකාබද්ධිත සමාගමේ ලිපිනය අංක 117, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කීල්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

2015ක් වූ පෙබරවාරි මස 20 වැනි දින දී ය.

03-333

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරවයි

සමාගම සංස්ථාපනය කිරීම

සමාගමේ නම : කේවීස් ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 103344
ලියාපදිංචි ලිපිනය : අංක 343, නව නුවර පාර, කොතලාවල, කඩුවෙල
සංස්ථාගත කළ දිනය : 2015.01.20

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු.

03-334

---

### සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කේ ආර් ක්‍රියේටිව් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 104044
ලියාපදිංචි කාර්යාලය : අංක 450/2සී, අකුරේගොඩ, වැව පාර, 3 වැනි පටුමග, තලංගම දකුණ, බත්තරමුල්ල.

03-340

---

### සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ගාර්ටන්ස් ආර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100099
සංස්ථාගත කිරීමේ දිනය : 2014 අගෝස්තු 06
ලියාපදිංචි කාර්යාලය : අංක 18/3, කේ. රූබන් පෙරේරා මාවත, බොරලැස්ගමුව

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-374

---

### සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව 2014 නොවැම්බර් මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ආකාරයට සමාගමේ නම වෙනස් කළ බවට (8 වන වගන්තිය ප්‍රකාරව) කරනු ලබන ප්‍රසිද්ධ නිවේදනයයි

සමාගමේ කලින් තිබූ නම : එවර්ග්‍රීන් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 14894
සමාගමේ ලිපිනය : අංක 38 ඒ, ඉහලගම, ගම්පහ
සමාගමේ නව නාමය : සිල්ක් රෝඩ් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-375

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : කේ. එස්. කැපිටල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101135
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 25 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 10/ඞී ද ලැස්ඞ්මාර්ක්, 385 ගාලු පාර, කොළඹ 03.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-376

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : පොලාරිස් ඉන්ටනැෂනල් හෝල්ඩිංස් කම්පණි ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 5234
සංස්ථාගත කළ දිනය : 2014 නොවැම්බර් මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 312/4, මීගමු පාර, කුරුණෑගල.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-377

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : ඔසින් ගෲප් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102433
සංස්ථාගත කළ දිනය : 2014 නොවැම්බර් 26 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 48/1, හැව්ලොක් පාර, කොළඹ 05.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-378

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : කෙයාර් ටෙක්නොලොජි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100664
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 03 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, කඳවල වත්ත, රත්මලාන.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-379

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ ප්‍රකාර නිවේදනය

සමාගමේ නම : සුප්‍රීම් සිමෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101288
සංස්ථාගත කළ දිනය : 2014 ඔක්තෝබර් 03 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : 33 වන මහල, බටහිර කුළුණ, ඇචලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-380

---

### සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : ඕස්ට්‍රේලියන් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102609
සංස්ථාගත කළ දිනය : 2014 දෙසැම්බර් 04 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 48/1, හැව්ලොක් පාර, කොළඹ 05

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-381

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : බෆලෝ සිමෙන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101152
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 26 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 38 ඒ, ඉහළගම, ගම්පහ

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-382

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය

සමාගමේ නම : සෙලෙස්නෙව් පී. ඇන්ඩ් සන් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 78761
සංස්ථාගත කළ දිනය : 2011 මැයි මස 10 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 91 - 2/1, ගාලු පාර, කොළඹ 04

ගෲප් මැනේජ්මන්ට් ඇන්ඩ් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

03-383

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**ගාල්ල, වදුරඹ බී. සැම්සන් රාජපක්ෂ මාවතේ වරිපනම් අංක 28 දරන ස්ථානයේ තබා හෝ ගබඩා කර ඇති අංග සම්පූර්ණ මුද්‍රණාලයක් සඳහා අවශ්‍යවන්නාවූ යන්ත්‍රෝපකරණ**

ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින් මතුවට ස්ථිරවම සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම යන්ත්‍ර සූත්‍ර උපකරණ ඇමුණුම් ද ඇතුළුව එයට පමණක් සීමා නොවී විදුලිය සැපයීමේ පද්ධතිය සහ විදුලි සංදේශ පද්ධතිය සහ,

(1) රිසෝග්‍රාෆ් සුපර් ඩිජිටල් ඩුප්ලිකේටරය ඊ ප්‍රින්ටරය - වර්ගය MZ 770 විත් ස්ටෑන්ඩ් - ටු කලර්, (2) කොනිකා මිනෝල්ටා Bizhub වර්ණ ඡායා පිටපත් යන්ත්‍රය/ස්කෑනරය - වර්ගය සී 250 (3) හයිටෙක් ඩේටා ප්‍රොසෙසින් ග්‍රැෆික් ආර්ට් කම්පියුටර් අවුට් පුට් ඩිවසින් යන්ත්‍රය FT 5055, (4) ඕෆ්සෙට් ස්පීඩ් ටු කලර් වර්ණ ඡායා පිටපත් යන්ත්‍ර 1යි, (5) අංග සම්පූර්ණ බයින්ඩින් යන්ත්‍ර 1යි, KFW V ණය යෝජනා ක්‍රම යටතේ,

ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. යූ. රනෝජිනී විසින් සහතික කරන ලද අංක 226 සහ 303 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම 1982 අංක 17 දරන සමාගම් ආඥාපනත යටතේ සංස්ථාගත කර ගාල්ලේ සිය ලියාපදිංචි ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යන්නාවූ උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම විසින් පැහැර ඇති බැවින්, ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වංචල දේපළ වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 10 වැනි දින පස්වරු 12.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2015.02.27 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2015.11.02 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" යන පුවත් පත් සහ "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු යි. (1) සම්පූර්ණ ගැණුම් මුදල ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1.500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 - 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංක : 2873656, 0777 - 672082 ෆැක්ස් අංකය : 2871184

03-331

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

**ගාල්ල ඇතිලිගොඩ පිහිටා ඇති රූඩ් 03 පර්චස් 17.8ක් විශාලැති අගනා දේපළක්**

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ අතිලිගොඩ හි පිහිටි කදුරුගහඹිවිට නොහොත් කැබැල්ලගහඹිවිට යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ගාවින්ද සිල්වා විසින් මැන සාදන ලද වර්ෂ 1984.07.10 දින අංක 2485 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 3A දරන ඉඩම් කොටස.

බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ගාවින් ද සිල්වා විසින් ඉහත කී 3A දරන ඉඩම් කොටස වර්ෂ 1992.11.09 දින නැවත මැන අනු කොටස් 3කට බෙදා වෙන් කර සාදන ලද අංක 4181 දරන නව පිඹුර පරිදි ලොට් 1 දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 18.25ක් ද, ලොට් 2 දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 22.70ක් සහ ලොට් 3 අඩි 15ක් පලල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් 16.55ක් ද වේ. ඒ සමගම ඒ තුළ පිහිටා ඇති ගොඩනැගිලි සහ ඉඩමේ සහ පරිශ්‍රයේ දැනට සහ මින් මතුවට ස්ථිරවම සවි වී හෝ සවිකර හෝ සම්බන්ධ කර ඇති සෑම සහ සියලුම යන්ත්‍ර සූත්‍ර උපකරණ ඇමුණුම් ද ඇතුලුව එයට පමණක් සීමා නොවී විදුලිය සැපයීමේ පද්ධතිය සහ විදුලි සංදේශ පද්ධතිය, සහ

ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. යූ. රනෝජනී විසින් සහතික කරන ලද අංක 224 සහ 301 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම 1982 අංක 17 දරන සමාගම් ආඥාපනත යටතේ සංස්ථාගත කර ගාල්ලේ සිය ලියාපදිංචි ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යන්නාවූ උපුලි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස් (පුද්ගලික) සමාගම සහ පුවක්දණ්ඩාවේ ලොකුආචාරිගේ සෝමපාල යන අය විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 10 වැනි දින පෙරවරු 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2015.02.27 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2015.11.02 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" යන පුවත් පත් සහ "තිනකුරල්" යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ විය හැකි මාර්ගය.*- ගාල්ල නගරයේ සිට (තනිපොල් ගහ හන්දිය හරහා) කරාපිටිය පාරේ මිලිද්දූව මංසන්ධිය දක්වා ගමන් කර දකුණට ඇති හේලි පාරේ මීටර් 300ක් පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත. එම දේපළ ගාල්ල හේලී පාරේ වරිපනම් අංක 30 ලෙසට හඳුන්වා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු යි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1.500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද, වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011 - 7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංක : 2873656 0777 - 672082
ෆැක්ස් අංකය : 2871184

03-332

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - වාරියපොල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාවිතාරණ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2008.07.24 දිනැති සහ අංක 1990, 2010.04.20 දිනැති සහ අංක 2380 සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ගාල්ලගේ විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2012.03.29 දිනැති සහ අංක 1589 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කොයෙල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු වශයෙන් සහ වැලිසරගේ සුනිල් ප්‍රනාන්දු උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 09 වැනි දින පෙ. ව. 10.30 ට මෙම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.*- වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ වල්ගම්පත්තු කෝරළේ වාරියපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ කටුපොත ග්‍රාමයේ පිහිටි පල්ලියවත්ත කැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී.එස්. ගොරොක්ගහගොඩ විසින් පිළියෙල කරන ලද 1990.10.25 වැනි දිනැති සහ අංක 298 ඒ රන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් විශාලත්වය අක්කර එකයි පර්චස් දහසයක් (අ. 01, රූ. 0 පර්. 16).

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.11.03 වැනි දින ලක්බිම තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කුරුණෑගල නගරයේ සිට පුත්තලම් පාරේ මහකෙළිය දක්වා කිලෝ මීටර් 13ක් ගමන් කොට ඉන් වමට හැරී කටුපොත දක්වා කිලෝ මීටර් 12ක් අදාළ දේපළට ළඟාවීම සඳහා ගමන් කරන්න. කටුපොත

මංසන්ධියට ළංවීමට මීටර් 300ක් මෙපිටින් පාරේ වම් පැත්තේ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
0112 - 337707.
ෆැක්ස් අංකය : 0112 - 337707.

03-341

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2012.06.30 දිනැති සහ අංක 1638 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයන්ත ලක්ෂ්මන් වීරසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2015ක් වූ අප්‍රේල් මස 20 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ හොන්නන්තර පිහිටි කහටගහලන්ද සහ ගොඩපොරගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. ගුණසේකර විසින් මැන සාදන ලද 2007.06.08 දිනැති අංක 10689 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම විශාලත්වය පර්චස් දාසයයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 16.3) විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.03.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.03.25 වැනි දින ලක්බිම තිනකරන් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - බොරලැස්ගමුවේ සිට හොරණ බස් මාර්ගයේ හොරණ දෙසට ගමන් කර මිරිස්වත්ත හන්දියෙන් වමට ඇති කොට්ටාව පාරට හැරී කි. මී. 2ක් ඉදිරියට ගොස් වම්පැත්තේ ඇති ඩොල්ෆින් සේවා ස්ථානය ද පසුකොට දකුණට ඇති විජේනන්දනාරාම පාරට ඇතුළුව මීටර් කිහිපයක් ඉදිරියට ගොස් වම්පස ඇති අදාළ දේපළ දක්වා දිවෙන අඩි 10ක් පළල පාරට හැරෙන්න. මෙම දේපළට කොට්ටාවෙන් ද ප්‍රවේශය ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478
0112 - 337707.
ෆැක්ස් අංකය : 0112- 337707.

03-342

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගිරිඋල්ල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ හා ලියාපදිංචි කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ දිවුලපිටිය ගමේ පිහිටි කොට්දැල්ගොඩැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විතාරණ විසින් 1999 සැප්තැම්බර් මස 23 සහ 24 දිනවල සාදන ලද අංක 3553 දරන පිඹුරේ ලොට් 12 දරන ප්‍රමාණය පර්චස් දහතුනයි දශම එකයි හතක් (අ. 0 රූ. 0 පර්. 13.17) විශාල ඉඩම, ගොඩනැගිලි ගසකොළ සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

පහත සඳහන් මාර්ග වෙන්කිරීම මතින් ඇති නිදහස් පරිහරණ අයිතිය සමග වේ.

ඉහත සඳහන් දිවුලපිටිය ගමේ පිහිටි කොට්දැල්ගොඩැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විතාරණ විසින් 1999 සැප්තැම්බර් මස 23 සහ 24 දිනවල සාදන ලද අංක 3553 දරන පිඹුරේ ලොට් 25 (මීටර් 6ක් පළල පාරක්) සඳහා වෙන්කිරීම පර්චස් විසිඅටයි දශම හතරයි තුන (අ. 0 රූ. 0 පර්. 28.43)

**දෙවැනි උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ කටුගම්පල හත්පත්තුවේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකඳුර ග්‍රාම නිලධාරී වසමේ මාකඳුර ගමේ පිහිටි මාකඳුර වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් 2002 අප්‍රේල් 08 වැනි දින සාදන ලද අංක 8032 දරන පිඹුරේ ලොට් 01 දරන ප්‍රමාණය අක්කර එකක් (අ. 1 රූ. 0 පර්. 0) විශාල ඉඩම, ගොඩනැගිලි, ගසකොළ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ අළුත්කුරු කෝරළේ මීනුවන්ගොඩ නගර සභා සීමාවේ වෑගොව්ව ගමේ පිහිටි මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මීනුවන්ගොඩ 125/2, ග්‍රාම නිලධාරී වසමේ වරිපනම් අංක 199/1 දරන ගොරකගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් 2012 අප්‍රේල් මස 28 වැනි දින සාදන ලද අංක 5108 දරන පිඹුරේ ලොට් 01 දරන ප්‍රමාණය රූඩ් දෙකක් (අ. 0 රූ. 2 පර්. 0) විශාල ඉඩම ගොඩනැගිලි, ගසකොළ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් 2012 අප්‍රේල් මස 28 වැනි දින සාදන ලද අංක 5107 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන මාර්ග වෙන්කිරීම මතු පිටින් හා ඒ දිගේ නිදහසේ ගමන් කිරීමට සහ අනෙකුත් අදාළ අයිතින් සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ අලුත්කුරු කෝරළේ මීනුවන්ගොඩ නගර සභා සීමාවේ මැදමුල්ල ගමේ පිහිටි දිවුලපිටිය පාරේ වරිපනම් අංක 201/6 දරන ගොරකගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් 2012 අප්‍රේල් මස 28 වැනි දින සාදන ලද අංක 5107 දරන පිඹුරේ ලොට් 1 දරන (මෙය පාරක් සඳහා වෙන් කිරීමකි) පර්චස් දෙකයි දශම තුනයි තුන (අ. 0 රූ. 0 පර්. 2.33)

මෙහි පළමුවන, දෙවැනි සහ තුන්වල උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ ආශා ඉන්ටර්නැෂනල් නමින් තනිපුද්ගල වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන වලාන ගොඩගේ ආශා අංජලී රණවීර ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ

(1) පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 12 (අ. 0 රූ. 0 පර්. 13.17)
වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 06 වැනි දින පෙ. ව. 11.00 ට

(2) තුන්වන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 1 (අ. 0 රූ. 2 පර්. 0)
වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 06 වැනි දින ප. ව. 1.00 ට

(3) දෙවන උපලේඛනයේ සඳහන් දේපළ ලොට් 1 (අ. 1 රූ. 0 පර්. 0)
වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 07 වැනි දින පෙ. ව. 11.00 ට

ඉහත උපලේඛනවල සඳහන් ස්ථානවල දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.01.02 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.03.13 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2015.03.16 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩම්වලට පිවිසීම.* -

1 වන උපලේඛනය - ලොට් 12

දිවුලපිටිය හන්දියේ සිට ගිරිඋල්ල පාරේ මීටර් 150ක් ගොස් වමට හැරුණු විට තිබෙන අඩි 20ක් පළල බොරළු පාරේ මීටර් 20ක් පමණ ගියවිට අදාළ දේපළ එම ඉඩමට මායිම්ව පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

2 වන උපලේඛනය - ලොට් 1

මාකඳු නගරයේ සිට එළිවිල පාරේ මිටර් 800ක් පමණ ගියවිට අදාළ දේපළ එම ඉඩමට මායිම්ව එම පාරේ වම්පසින් පිහිටා ඇත. .

3 වන උපලේඛනය - ලොට් 1

මීනුවන්ගොඩ හන්දියේ සිට දිවුලපිටිය පාරේ මීටර් 500ක් ගියවිට සමරකෝන් ට්‍රැක්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් හමුවේ. එතැනින් වමට හැරුණු විට තිබෙන කොන්ක්‍රීට් පාරේ මීටර් 30ක් ගමන් කළ විට අදාළ දේපළ එම ඉඩමට මායිම්ව එම පාරේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යः-

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ අගය මත බද්ද (VAT) ගෙවිය යුතු යි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගිරිඋල්ල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2445393,
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංක 191, මීගමුව පාර,
මහාවීදිය, ගිරිඋල්ල.
දුරකථන අංක 037 - 2288338,
ෆැක්ස් අංකය : 037 - 2288341.

03-391

---

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

වැවලගේ ටියුඩර් ගාමිනී ප්‍රනාන්දු,
අංක 102/ඒ, බසියා වත්ත,
තලාහේන, මීගමුව.

....................................*පැමිණිලිකරු.*

නඩු අංකය : 3455/එම්. බී.

*එදිරිව*

මිහිඳුකුලසූරිය එම්මානුවෙල් ජෝශප් ක්ලෙමන්ට් ප්‍රනාන්දු,
අංක 132, පිටිපන වීදිය,
මීගමුව.

............................*විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතය,

මීගමුව දිසා අධිකරණයේ නඩු අංක 3455/එම්. බී. දරන නඩුවේ වර්ෂ 2013.12.10 දිනැති (2014.05.06 වැනි දින කරන ලද සංශෝධනයන් ද සහිතව) මීගමුව දිසා අධිකරණයේ ගරු අතිරේක දිසා විනිසුරු තැන්පත් ආර්. පී. ඩී. පී. සී. රත්නායක මැතිතුමා විසින් 2014.05.06 වැනි දින කරන ලද නියෝගවලට ද යටත්ව, මෙහි පහත සඳහන් පරිදි නියෝග කර තීන්දු ප්‍රකාශය කරන ලදී.

එනම්, පැමිණිලිකරුට විත්තිකරුගෙන් රුපියල් එක් ලක්ෂ විසිදහස (රු. 120,000) ක මුදලක් අයකර ගැනීමට හැකි බවට තීරණය කරන අතර, එසේ ම එම මුදල මත, තීන්දු ප්‍රකාශයේ දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් නෛතික පොලිය ද, අයකර ගත හැකි බවට නියෝග කර තීන්දු ප්‍රකාශය කරන ලදී.

තව ද, එම මුදල විත්තිකරු විසින් නොගෙවන්නේ නම්, පැමිණිල්ලේ උපලේඛනගත දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එකී මුදල අයකර ගැනීම සඳහා පැමිණිලිකරුට අවස්ථාව ඇති බවට තීරණය කර, ඒ අනුව නියෝග කර තීන්දු ප්‍රකාශ කරන ලදී.

එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව, විත්තිකරු ක්‍රියාකිරීමට අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකරදීම සඳහා මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර එකී නිශ්චල දේපළ, වර්ෂ 2015ක් වූ අප්‍රේල් මස 10 වැනි දින පෙ. ව. 10.30 ට එකී දේපළ පිහිටා ඇති මීගමුව, පිටිපන වීදියේ, අංක 132 දරන ස්ථානයේ දී, ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. තක්සේරු ගාස්තු 0.5%ක් ද,
3. වෙන්දේසිය ගැසට් පත්‍රයේ පළකිරීමේ ගාස්තු ද,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම් ද,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද,
6. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2.5% ක මුදලක් ද,
7. පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු 1% ක ගාස්තු ව ද,
8. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා වූ සියලු වියදම් ද,
9. රජයේ ෆවුන්ඩේජ් ගාස්තු ද,
10. ලිපිකරු හා සෝෂක ගාස්තු ද,
11. බැනර් ප්‍රසිද්ධ කිරීමට පළාත් පාලන ආයතනයට ගෙවන ගාස්තු ද.

ගැණුම්කරු විසින් විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

උපලේඛනය

ඩබ්. එස්. එස්. පෙරේරා මිනින්දෝරු තැන 1989.10.24 වැනි දින මැන සෑදූ අංක 2802 දරන පිඹුර මත 2001.11.02 වැනි දින උප බෙදුමකින් වෙන්කළ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ දිසාවෙහි අළුත්කුරු කෝරළයේ, දාසිය පත්තුවේ, මීගමුව මහ නගර සීමාව තුළ පිටිපන පිහිටි පිටිපන වීදියේ වරිපනම් අංක 132 දරන බම්බිගහවත්තේ අංක "2" දරන කොටසට උතුරට : අංක 1 දරන කොටස ද, නැගෙනහිරට : එම්. කේ. කේ. පෙරේරාට සහ එම්. කැනීසියස් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, දකුණට : එම්. කැනීසියස් ප්‍රනාන්දුට අයිති ඉඩම ද, සහ බස්නාහිරට : ගම්සභා පාර ද, මායිම් වූ පර්චස් දහසයයි දශම නවයයි පහක් (අක්. 0, රූ. 0, පර්. 16.95) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගසකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියල්ලයි.

ලියාපදිංචිය : මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය : සී 850/126

අයි. සී. ඒ. පෙරේරා,
සාම විනිසුරු,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු, තක්සේරුකරු.

අංක 86,
නව නුවර පාර,
වැලිවේරිය,
දුරකථන අංක : 033- 2255115, 077-3698690.
2015 ක්වූ පෙබරවාරි මස 20 වැනි දින.

03-395

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්,
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
11 වැනි මහල, අංක 28,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

..................................*පැමිණිලිකරු.*

*එදිරිව*

නඩු අංකය :
DMB/0034/12

රංහොටීගේ සුලලිත ශාන්ත කුමාර සේනානායක,
අංක 06, පානම්බලම පාර,
මීගමුව පාර,
කුරුණෑගල.

*නිවැරදි ලිපිනය*

අංක 06, පානම්බලන පාර,
මීගමුව පාර,
කුරුණෑගල.

..........................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර තිබෙන තීන්දු ප්‍රකාශය මගින් රුපියල් එක්කෝටි නවලක්ෂ අසූ එක්දහස් හතයි ශත විසිඑකක (රු. 1,981,007.21) මුදලක් සහ ඒ සඳහා 2011 ක් වූ නොවැම්බර් මස 30 වැනි දින සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනතුරු මසකට සියයට හතරක් (4%) බැගින් පොලිය ද, සමග ගෙවිය යුතු බව නියෝග කර ඇති බැවින් ද,

ඉහත සඳහන් මුදල අය කරගැනීම සඳහා පැමිණිලිකාර බැංකුවට උකස් කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර තිබෙන ඉඩම හා පරිශ්‍රය (එහි පිහිටි විශාල නිවස සමග) ඒ තුළ පිහිටි අන් සියලු දේවල් සමග බැඳී ඇති බව හා වෙන්දේසි කළ හැකි බව එකී තීන්දු ප්‍රකාශය මගින් තවදුරටත් නියෝග කර ඇති බැවින් ද,

ඉහත සඳහන් මුදල තීන්දු ප්‍රකාශය දිනයේ සිට මාස දෙකක් (02) ඇතුළත ගෙවීම ඉහත නම සඳහන් විත්තිකරු විසින් පැහැර හැරියහොත්, තීන්දු ප්‍රකාශයේ විධානයන් ප්‍රකාර හා උකස් පනතේ විධිවිධානවලට අනුකූලව පැමිණිලිකාර බැංකුවට උකස් කරන ලද හා මෙහි පහත උපලේඛනයේ විස්තර කර තිබෙන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙම අධිකරණය මෙම අධිකාරී පත්‍රය මගින් මාව පත්කර සංස්ථාපනය කර බලය පවරා දී ඇති බැවින් ද,

ඉහත සඳහන් කරුණු ප්‍රකාර මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර තිබෙන දේපළ වර්ෂ 2015ක් වූ මාර්තු මස 30 වැනි දින 2.30 ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ මැද පත්තුවේ අලුත්නුවර ගමේ පිහිටි "හිටිනවල්ලුවේවත්ත"යන ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. අළුවිහාරේ මානක තැන විසින් 1964 ක් වූ ජනවාරි මස 14 වැනි දින මැන සාදන ලද පිඹුරේ කැබලි අංක 3 දරන කොටසට මායිම්, උතුරට : තිබ්බතුගේන පැල ඉනි වැට ද, නැගෙනහිරට: කැබලි අංක 4 ද, දකුණට : පී. ඩබ්ලිව්. ඩී. පාර කටුගහවත්ත සිට හින්ගුල අංක 32 B සහ බටහිරට : කැබලි අංක 2 යන මායිම් තුළ වූ රූඩ් දෙකයි පර්චස් තිස් දෙකයි තුනෙන් දෙක ( අ. 0 රූ. 2 පර්. 32 2/3) ක් විශාලත්වයෙන් යුතු ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ. මෙකී ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 604/273 යන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී කැබලි අංක 3 පහත විස්තර කර ඇති ඉඩම නැවත මැනීමක් වේ.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ මැද පත්තුවේ අළුත්නුවර ගමේ පිහිටි "හිටිනවල්ලුවේවත්ත" යන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එස්. පණ්ඩිතරත්න මානක තැන විසින් 2004 ක් වූ ජූලි මස 28 වැනි දින මැන සාදන ලද පිඹුරේ කැබලි අංක 3 දරන කොටසට මායිම්, උතුරට : තිබ්බතුගේන පැල ඉනි වැට ද, නැගෙනහිරට : කැබලි අංක 4 ද, දකුණට : පී ඩබ්ලිව්. ඩී. පාර කටුගහවත්ත සිට හිඟුල අංක 32B සහ බස්නාහිරට : කැබලි අංක 2 ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස් දෙකයි තුනෙන් දෙක (අ. 0 රූ. 2 පර්. 32 2/3) ක් විශාලත්වයෙන් යුතු ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සියලු දේ ද වේ. මෙකී ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 804/215 යන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*දේපළට පිවිසීම.* - කොළඹ නුවර පාරේ කෑගල්ල හින්ගුල හන්දියෙන් දකුණට ඇති පාරේ කි. මී. 2 1/2ක් පමණ ගිය විට අළුත්නුවර හන්දිය හමුවේ. එම හන්දියෙන් දකුණට ඇති උයන්වත්ත පාරේ මීටර් 500ක් පමණ ගිය පසු වම් පසට වන්නට අළුත් නුවර කණිෂ්ඨ විද්‍යාලය හමුවේ. එම විදුහල ඉදිරියේ පාරේ දකුණු පසට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත එවෙලේ ම මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. ගැණුම් මිලෙන් සියයට විසිපහක් (රු. 25%) ක්,
02. අධිකරණයෙන් අනුමත කර ඇති ගාස්තු චක්‍රය අනුව වෙන්දේසිකරුගේ ගාස්තු ද,
03. රජයේ ගාස්තු ද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම් ද, එවෙලේ ම වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.
04. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල දින තිහක් (30) ඇතුළත ගරු අධිකරණයේ නඩුවට අදාළ ගිණුමට තැන්පත් කළ යුතු ය.

වැඩි විස්තර සඳහා කළමණාකරු නීති නිලධාරි මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් ලංකා බැංකු මර්චන්ට් කුළුණ, අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

ඉන්දු හේවාවිතාරණ,
මහාධිකරණ සහ දිසා අධිකරණ
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු, වෙන්දේසිකරු,
සාම විනිසුරු (මුළු දිවයිනටම)

අංක එච් 1/16,
සංචිආරච්චි වත්ත,
කොළඹ 12.
දුරකථන අංක : 072-4459575, 072-2580932.

03-413

**සෙලාන් බැන්ක් පී. එල්. සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ, කටුකැලේ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, ව්‍යාපාරික කලාපය තුළ පිහිටි වරිපනම් අංක 541 සහ අංක 543 දරන පරිශ්‍රය බලයලත් මානක පී. එච්. ටී. ද සිල්වා විසින් සාදන ලද සහ 2011.05.25 වැනි දින අංක 2495 දරන සැලැස්මේ නිරූපිත ලොට් 1 දරන බෙදා වෙන් කර ඇති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 16.02 (හෙක්ටයාර් 0.04054)

මෙම දේපළ මහනුවර සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන කුසුම්සිරි සප්ලයර්ස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන දඩල්ලගේ නන්දසිරි සිල්වා සහ කුමාරපති මොහොට්ටිලාගේ චිත්‍රා සිල්වා යන අය බන්ධනදායින් වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- මහනුවර නගර මධ්‍යයේ සිට පේරාදෙණිය පාර (සිරිමාවෝ බණ්ඩාරනායක මාවත) ඔස්සේ කි. මී. 1.5ක් පමණ ගමන් ගත් විට දකුණ පසින් හමුවන රීගල් සිනමාහල ඉදිරිපිටින් අදාල දේපළ පිහිටා තිබේ.

2015 අප්‍රේල් මස 17 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.12.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2013.11.21 වැනි දින ඩේලිමිරර්, ලංකාදීප සහ 2013.11.25 වැනි දින තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකාරිණී (නීති), සෙලාන් බැන්ක් පී.එල්.සී. සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456458/011-2456477/011-2456488.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :071-4755974/071-8446374/077-7761706/081-2210595

03-401

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.- මාතලේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, ගලේවෙල ගමේ, දඹුල්ල-ගලේවෙල මාර්ගයට මායිම්ව කලහකැලේ නමැති ඉඩමට බලයලත් මානක එම්. රාජසේකරන් විසින් සාදන ලද 2006.02.08 වැනි දින අංක 1969ඒ හි නිරූපිත ලොට් 14 ඒ 1 සහ ලොට් 14 බී 1 දරන ඒකාබද්ධ කොටස් දෙක සහ එහි තුළ පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි ඇතුලු සියලු දේ. ඉඩමේ මුලු ප්‍රමාණය අක්කර 01 රූ. 01 පර්. 4.01 (ලොට් 14 ඒ 1 පර්චස් 37.64 ලොට් 14 බී -1 අක්. 01, පර්චස් 6.40 ඉහත සඳහන් ලොට් 02 එක් ඒකකයක් වශයෙන් විකුණනු ලැබේ.

මෙම දේපළ අසාන් අලියාර් අක්බාර් අමීන්ඩීන් සහ අක්බාර් අමීන්ඩීන් මොහොමඩ් අස්කාර් යන අය බන්ධනදායින් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - ගලේවෙල නගරයේ ඔරලෝසු කණුව අසල සිට දඹුල්ල මාර්ගයේ මීටර් 300ක් පමණ ගමන් ගත් විට මෙම මාර්ගයේ දකුණු පසින් මහා මාර්ගයට මායිම්ව පිහිටා තිබේ. (කි. මී. 76/1 සහ 76/2 බෝක්කුව අතරින් පිහිටා තිබේ.)

2015 ක්වූ අප්‍රේල් මස 16 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.12.09 වැනි දින ලක්බිම්, ඩේලිමිරර් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),

4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු, හැටන් නැෂනල් බැන්ක්, පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661826, 011-2661828, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :081-2210595/071-4755974/071-8446374/077-7761706

03-399

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නාවලපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ඉතා වටිනා පදිංචියට /ව්‍යාපාරයකට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහනුවර මහ නගර සභා සීමාවන් තුළ නගර මධ්‍යයට ඉතා සමීපව කටුකැලේ ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 255 තුළ සිරිමාවෝ බණ්ඩාරනායක මාවතෙහි (පෙර පේරාදෙණිය පාර) පිහිටි ඉඩමට බලයලත් මානක කේ. ඩබ්ලිව්. එම්. වී. මාපිටිගම විසින් මැනක දී මැන සාදන ලද 2012.11.30 වැනි දින අංක 698 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 6.4

මෙම දේපළ ටිකිරි හෙන්නැදිගේ ඉන්ද්‍රපාල, රෝහිණී ප්‍රේමවර්ධන සහ ටිකිරි හෙන්නැදිගේ අමිල චතුර ඉන්ද්‍රපාල ණයකරුවන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - මහනුවර නගර මධ්‍යයේ සිට සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ඔස්සේ (පේරාදෙනිය පාර) මීටර් 500ක් පමණ පේරාදෙනිය දෙසට ගමන් ගත් විට මෙම පාරට මුහුණලා දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ. (වරිපනම් අංක 252, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත චූටි රෙස්ටෝරන්ට්)

2015 ක්වූ අප්‍රේල් මස 17 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.09.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2014.09.30 වැනි දින ඩේලි මිරර්, ලක්බිම හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක්, පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :081-2210595/071-4755974/071-8446374/077-7761706

03-402

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.